www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ දේශපාලන කුලල් කා ගැනීම් පිටුපස එක්සත් ජනපද-චීන එදිරිවාදිකම්

**Behind Sri Lanka's political infighting: US-China rivalry**

2010 ජනවාරි 29

ජනවාරි 26 දින පැවති ජනාධිපතිවරනයේදී ජයග්‍රහකයා වූ මහින්ද රාජපක්ෂ හා පරාජිතයා වූ ජෙනරාල් සරත් ෆොන්සේකාට පිටුබලය දීම සඳහා පාලක ප්‍රභූව දෙපැත්තට බෙදීමත් සමග, කටකතා සහ කුමන්ත්‍රන වලින් කොලඹ ඇවිලී ගියේය. උපාමාරු දැමීම් හා විවෘත දේශපාලන බල අරගලය සඳහා ඔවුහු පෙල ගැසෙමින් සිටිති. මැතිවරන ප්‍රචාරක ව්‍යාපාරයේ කලි කලහයන් නිමාවට පත්කිරීම කෙසේ වෙතත් මැතිවරනය, අස්ථාවරත්වය ගැඹුරු කිරීමට වේදිකාව සකසා තිබේ.

පසුගිය තෙදින තුල ඇතිවූ සුවිශේෂී සිද්ධීන් මෙසේය; සන්නද්ධ හමුදා බලඇනි ෆොන්සේකා ලැගුම්ගෙන සිටි හෝටලය වැටලීම, ඔහු කුමන්ත්‍රනයක් සැලසුම් කරමින් සිටියේය යන ආන්ඩුවේ චෝදනා, ආන්ඩුව තමන් අත් අඩංගුවට ගැනීමට නැතිනම් ඝාතනය කිරීමට යන බවට ෆොන්සේකා එල්ල කරන ප්‍රති-චෝදනා, මැතිවරනය අවලංගු කලයුතු බවට කෙරෙන ඉල්ලීම් හා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට දෙපාර්ශවයෙන්ම කෙරෙන තර්ජන යනාදියයි.

මෙම කටුක විසංවාදයන් පිටුපස ඇත්තේ කුමක්ද? අවශ්‍යයෙන්ම මේ දෙදෙනාට ඇත්තේ එකම දේශීය වැඩපිලිවෙලකි. පසුගිය මැයි මාසයේ එල්ටීටීඊයට පරාජය අත්කර දෙමින් අවසානයට පැමිනි වර්ගවාදී යුද්ධය නිර්දය ලෙස ක්‍රියාත්මක කල ජෙනරාල් ෆොන්සේකා, ජනාධිපති රාජපක්ෂගේ අභ්‍යන්තර කල්ලියේ හවුල් කාරයෙක් විය. දැන් ෆොන්සේකා රටේ ප්‍රජාතන්ත්‍රවාදයට නැවුම් හුස්මක් පිඹින්නෙමියි පොරොන්දු වුවත් රාජපක්ෂ මෙන්ම ඔහුත් යුද අපරාධවලට සහ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීමට වග කිව යුතුය. තමන් ඝාතනය කරනු ඇතැයි හෙතෙම බිය වන්නේ නම් ඒ, පසුගිය සිවු වසර පුරා දේශපාලඥයින්, මාධ්‍යවේදීන් සහ සාමාන්‍ය ජනතාව සිය ගනනින් මරා දමන ලද ආන්ඩු-ගැති ඝාතක කල්ලිවල මෙහෙයුම් පිලිබඳව ඔහු ඉතා සමීපව හා හොඳින් දැනුවත්ව සිටින හෙයිනි.

පුද්ගලයන් දෙදෙනාගේ ම ආර්ථික න්‍යාය පත්‍රය කිසිසේත්ම එකිනෙකින් වෙනස් නැත. තමන්ට ඉටු කල නොහැකි යයි දෙදෙනාම හොඳින් දැන සිටි, හිතුමතේ දුන් පොරොන්දුවල පදනම මත ඔවුහු මැතිවරන ව්‍යාපාරය ගෙන ගියහ. දිවයින "ආසියාවේ විශ්මය" බවට පත් කිරීමටත්, මාස හයක් ඇතුලත ඒක පුද්ගල ආදායම දෙගුනයක් කිරීමටත් රාජපක්ෂ පොරොන්දු විය. ෆොන්සේකා, රටේ සියලු ප්‍රශ්න "නාස්තිය හා දූෂනය" අතුගා දැමීමෙන් විසඳන්නෙමි යයි කටහැකර ලෙස කියා සිටියේ, විසි හය වසරක සිවිල් යුද්ධයේ බලපෑම හා වත්මන් ගෝලීය ආර්ථික කඩා වැටීම, රාජපක්ෂ සහෝදරයන්ගේ දූෂිත භාවිතාවන්ට තිත තැබීම මගින් ජය ගත හැකිවාක් සේය. යථාර්ථයේ දී රාජපක්ෂ සහ ෆොන්සේකා යන දෙදෙනාම, නරක අතට හැරෙන ආර්ථික අර්බුදයේ මුලු බර වැඩ කරන ජනතාවගේ කර මත පැටවීමටත්, කුමන හෝ විරුද්ධත්වයක් මැඬීමට යුද්ධයේ අවධිය තුල වාත්තු කරගත් පොලිස්-රාජ්‍ය මෙවලම යොදා ගැනීමටත් කැපවී සිටිති.

දේශපාලන කාකොටා ගැනීමට මූලික හේතුව කොලඹ තුලින් සොයා ගත නොහැකිය. එල්ටීටීඊය පරාජය වූ තැන් පටන්, මහ බලවතුන්ගේ පසමිතුරුකම්වල සුලිය වෙතට රට ඇදගෙන ගොස් තිබේ. ප්‍රමුඛ බලවතුන්ගේ වැඩෙමින් පවත්නා උත්සුකය යොමුවී ඇත්තේ, දකුනු ආසියාව තුල ශ්‍රී ලංකාවේ මූලෝපායාත්මක පිහිටීම සහ මැද පෙරදිග හා අප්‍රිකාවේ සිට ඊශාන දිග ආසියාව දක්වාත්, පැසිෆික් සාගරය හරහාත් වැටී ඇති ප්‍රධාන මුහුදු මාර්ගවල කේන්ද්‍රස්ථානයේ එහි පිහිටීමත් වෙතය. නාවික වෙලඳාම සුරක්ෂිත කරගැනීමට මංසොයමින් සිටින චීනය,

කොලඹ තුල තම තත්වය ශක්තිමත් කර ගැනීම සඳහා යුද්ධය ප්‍රයෝජනයට ගත්තේ ය. කොලඹ ආන්ඩුවට අවි ආයුධ, ආධාර හා රාජ්‍ය තාන්ත්‍රික පිටුබලය සපයමින් චීනය, ආර්ථික සහ මූලෝපායාත්මක සහන, විශේෂයෙන් හම්බන්තොට ප්‍රධාන හා අලුත් දක්ෂින වරායක් ඉදිකිරීම ඇතුලු සහන, පෙරලා බලාපොරොත්තු විය. යුරෝපීය බලවතුන් මෙන්ම ඉන්දියාව සහ පාකිස්ථානය ද ලංකාව තුල තම තමන්ගේ තත්වය නංවා ගැනීමට තරග වැද සිටිති.

කෙසේ වෙතත්, ලංකාව ද ඇතුලුව ආසියාවේ හා ජාත්‍යන්තරව වැඩෙමින් පවත්නා චීන බලපෑමට වැට බැඳීමට අදිටන් කරගෙන සිටින එක්සත් ජනපදය, ප්‍රධාන අස්ථාවරකාරී සාධකය බවට පත්ව තිබේ. රාජපක්ෂගේ යුද්ධයට තල්ලුව දුන් ඔබාමා පාලන තන්ත්‍රය, එල්ටීටීඊ පරාජයෙන් අනතුරුව, "මානව හිමිකම්" තුරුම්පුව නරුම ලෙස හරඹ කලේය. රාජපක්ෂ ආන්ඩුවට පීඩනය යෙදීමේ උපායක් වශයෙන් වොෂිංටනය, යුරෝපීයන් සමග අත්වැල් බැඳගෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාව සීමිත යුද අපරාධ පරීක්ෂනයකට යටත් කිරීමට කැඳවුම් කරන යෝජනාවකට අනුග්‍රහය දැක්වුවේය. කෙසේ වෙතත් චීනය, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් තම සිරුරේ හිරි ඇරගනිමින් යුරෝපා/එක්සත් ජනපද යෝජනාව අවහිර කල අතර "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ජයගැනීම ගැන පම්පෝරි ගැසූ ශ්‍රී ලංකා ආන්ඩුවේ යෝජනාවට සහය දුන්නේය.

දෙසැම්බර් මුල් දිනවලදී එක්සත් ජනපදය සිය ප්‍රතිපත්තිය මාරු කලේය. "ශ්‍රී ලංකාව; යුද්ධයෙන් අනතුරුව එක්සත් ජනපද මූලෝපාය යලි සැලසුම් කිරීම" නම්වූ ප්‍රමුඛ වාර්තාවකින්, කොලඹ තුල දැඩිවන චීන බලපෑම මඟින් එක්සත් ජනපද මූලෝපායාත්මක අවශ්‍යතාවන්ට එල්ල කර ඇති තර්ජනය පිලිබඳව අවධාරනය කල අතර, "එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව 'අහිමිකරගත' නොහැකියයි එක එල්ලේම සඳහන් කලේය. ආර්ථික, වෙලඳ සහ ආරක්ෂක දිරිගැන්වීම් වලින් "ශ්‍රී ලංකාව තුල එක්සත් ජනපද හස්තය ශක්තිමත් කරන නව ප්‍රවේශයක්" සඳහා එය උපදෙස් දුන්නේය. "මානව හිමිකම්" තවමත් වැදගත්කමක් උසුලන නමුත් "ශ්‍රී ලංකාව කෙරෙහි එක්සත් ජනපද ප්‍රතිපත්තියේ අධිකාරිත්වය, තනි න්‍යාය පත්‍රයක් මගින් පවත්වාගත නොහැක. සැබෑ ප්‍රතිසංස්කරනයන් ක්‍රියාත්මක කිරීමේ දී එය පලදායී නොවන අතර, කලාපය තුල එක්සත් ජනපද හු මූලෝපායික අවශ්‍යතා එමගින් අවතක්සේරු කෙරේ."

එක්සත් ජනපදය බැහැර කිරීමෙන් ඔහුට නරක-කල දසාවක් ඇති කල හැකිය යන්න පිලිබඳව රාජපක්ෂ බෙහෙවින් ම දැනුවත් ය. ජනාධිපතිවරන ක්‍රියාදාමය තුල දී, එල්ටීටීඊය ඊක ගැනීමේ හා හමුදාවට යුද අපරාධ චෝදනා ගෙන ඒමේ "ජාත්‍යන්තර කුමන්ත්‍රනයකට" තමා විරුද්ධවූ බවට ඔහු පාරම් බෑවේය. එහෙත් ඔහුගේ බටහිර-විරෝධී රංගනයේදී හා "පුංචි ශ්‍රී ලංකාව" ආරක්ෂා කිරීමේ දී සැමවිට ම එහිම සීමාවන් පැවතින. රාජපක්ෂ, ඇෆ්ගනිස්ථානය තුල වොෂිංටනයේ යුද අපරාධවලට ඇඟිල්ල දික් කලේ, තමන්ම යුක්තිසහගත කර ගැනීමේ අරමුනෙන් පමනකි. කිසිම විටෙක හෝ "කුමන්ත්‍රනකරුවන්" - එක්සත් ජනපදය හා යුරෝපා සංගමය - නම් වලින් සඳහන් නොකිරීමට ඔහු ප්‍රවේශම් වූ අතර, සියලුම සලකුනු අනුව දැන් පෙන්නුම් කෙරෙන්නේ එම රටවල් සමග සබඳතා වැඩි දියුනු කර ගැනීමට ඔහුට අවශ්‍යවී ඇති බවයි.

වොෂිංටනය සමග ෆොන්සේකාගේ සබඳතා අතිශයින්ම නොපැහදිලිය. පසුගිය ඔක්තෝබර් අවසන් දිනවල, තම (තාවකාලික පුරවැසි බලපත්‍රය) ග්‍රීන් කාඩ් පත අලුත් කර ගැනීමේ හා ඥාතීන් බැහැදැකීමේ අරමුනින් ඔහු එක්සත් ජනපදයට ගමන් කලේය. එහි දී ස්වදේශාරක්ෂක දෙපාර්තමේන්තුවේ ස්වේච්ඡා සම්මුඛ සාකච්ඡාවකට පැමිනෙන ලෙස ඔහුට දැනුම් දී ඇති අතර, වාර්තා වූ අන්දමට ඒ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධ  යුද අපරාධ පිලිබඳ ප්‍රශ්නවලට පිලිතුරු දීමටයි. අවසානයේ දී, සිදු නොවූ මෙම සම්මුඛ සාකච්ඡාව පිලිබඳව කොලඹ ආන්ඩුව තැතිගත් අතර, එයට දැඩි ලෙස විරුද්ධ විය. එක්සත් ජනපද නිලධාරීන් හා ෆොන්සේකා අතර පැවති සාකච්ඡාවන්ගේ ස්වාභාවය රහසිගත භාවයේ සැඟවී තිබේ. කොලඹට පෙරලා පැමින දින කීපයකින්ම හමුදාවෙන් ඉල්ලා අස්වීම නිවේදනය කල ඔහු රාජපක්ෂගේ බටහිර-විරෝධී ආස්ථානයට එරෙහිව ක්‍රියාශීලිව උද්ඝෝෂනයේ නිරත විය.

වොෂිංටනය හා රාජපක්ෂ පාලන තන්ත්‍රය අතර අනාගත සබඳතාවන්ගේ හැටි ස්වභාවය කිසිසේත්ම පැහැදිලි නැත. නිශ්චිත කාරනාව වන්නේ, මෙම බලවතුන්ගේ, විශේෂයෙන්ම එක්සත් ජනපදය හා චීනය අතර එදිරිවාදිකම්, ශ්‍රී ලංකා දේශපාලනයේ

අඩමාන හා අස්ථාවර එකතුවට පුපුරන සුලු නව සාධකයක් එක් කරමින් තිබෙන බවයි. ක්ෂනික ප්‍රතිඵලය කුමක් වුවත්, පාලක ප්‍රභූවේ කට්ටිවාදී කලි කලහය දායක වනු ඇත්තේ, ලොකු පුටුවට නැග ගන්නා කවරෙකු තුල වේවා, දිවයින මුහුන පා සිටින ආර්ථික අර්බුදය හා ඒ නිසාම, කම්කරු පන්තියේ සමාජ තත්වය මත දැඩි ප්‍රහාර එල්ල කිරීමේ අධිෂ්ඨානය, උත්සන්න කිරීමට පමනි.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org